# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,741 - 2012 ජනවාරි මස 13 වැනි සිකුරාදා - 2012.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 50 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 50 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 51 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 57 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජනවාරි මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජනවාරි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසුකරුවන් වෙත නිවේදනයයි

**මෙට්‍රික් ටොන් 72,525 ගර්භිත ඊයම් (Lead) අම්ල සංචායක කෝෂ (බැටරි) හා මෙට්‍රික් ටොන් 34,540 ගර්භිත ක්ෂාරීය කෝෂ (ඇල්කලයින් බැටරි) අපහරණය කිරීම සඳහා ප්‍රසම්පාදනය**

01. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ, (ප්‍රධාන) හි සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයෙන් මෙට්‍රික් ටොන් 72,525ක් වන ගර්භිත ඊයම් අම්ල සංචායක බැටරි (කෝෂ) හා මෙට්‍රික් ටොන් 34,540ක් වන ගර්භිත ක්ෂාරීය කෝෂ (alkaline Batteries) අපහරණය කිරීම සඳහා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2012.01.19 වැනි දින ප. ව. 2.00 ට අවසන් වේ.

03. දුම්රිය සේවා ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ දී ගෙවිය හැකි ආපසු ගෙවනු නොලබන රුපියල් 3,000.00ක් වන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් 2012.01.17 වැනි දින ප. ව. 3.00 දක්වා, කොළඹ 10, දුම්රිය සේවා ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වන ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු, භාරගන්නා වේලාව අවසන් වූ වහාම, එම ලංසු කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය සේවා මූලස්ථාන කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. එම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින ලෙස, ලංසුකරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් අය වෙත, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම කළ යුතු ය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය සේවා මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී, නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

07. වැඩිදුර විස්තර තොරතුරු ලබාගැනීම සඳහා කරුණාකර කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය සේවා ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරීතුමා වෙතින් විමසන්න.

දුරකථන අංක : 2432044/2436818.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන).

ශ්‍රී ලංකා දුම්රිය සේවය,
යොමු අංකය : SRS/F.6870.

01-360

---

# බඩු බාහිරාදිය විකිණීම

**දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - කයිට්ස්**

නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

රාජසන්තක කරන ලද/අයිතිකරුවෙකු නොමැති පහත සඳහන් නඩු භාණ්ඩ 2012.01.17 වැනි දින පැය 1000 ට කයිට්ස් අධිකරණයේ දී විකුණනු ලැබේ.

01. මෙම භාණ්ඩ සම්බන්ධව අයිතිකරුවන් ඉදිරිපත් වන්නේනම් වෙන්දේසියට ප්‍රථම අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

02. රෙජිස්ට්‍රාර් වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසිකරනු ලබන භාණ්ඩ වෙන්දේසියට ප්‍රථම මහජනයාට එම භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

03. අධිකරණයේ තීන්දුව ලබාදුන් භාණ්ඩ වෙන්දේසියට ප්‍රථම එම නඩුභාණ්ඩ වෙන්කර ගත හැක.

04. වෙන්දේසි නඩුභාණ්ඩ විකිණීමේ දී ගැණුම්කරුවන් මුදල් පමණක් ගෙවා අධිකරණයෙන් භාණ්ඩ ඉවත්කර ගත යුතු ය. (චෙක්පත් භාරගනු නොලැබේ.)

05. නඩු භාණ්ඩ ලබාගන්නා ගැණුම්කරුවන් ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

මහෙස්ත්‍රාත්/දිසා විනිසුරු,
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය,
කයිට්ස්.

**වෙන්දේසි භාණ්ඩ විස්තරය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *නඩු භාණ්ඩ වර්ගය* |
|---|---|---|
| 01. | 3900 | ජංගම දුරකථනය |
| 02. | 4264 | අල්පාටෙල් ජංගම දුරකථනය |
| 03. | 3335 (බී 30/10) | අල්පාටෙල් ජංගම දුරකථනය |
| 04. | 4124 | නොකියා ජංගම දුරකථනය |
| 05. | 4113 | සෝනිඑරික්සන් ජංගම දුරකථනය |
| 06. | 4111 | නොකියා මොඩල් ජංගම දුරකථනය |
| 07. | 4112 | සම්සුන් මොඩල් ජංගම දුරකථනය |
| 08. | 4017 | නොකියා ජංගම දුරකථනය |
| 09. | ඒ. ආර්. 38/11 | නොකියා ජංගම දුරකථනය |
| 10. | 4320 | උදලු 01 යි, යකඩ කියත් 01 යි |
| 11. | 3713 | උදලු එකයි |
| 12. | 132 | උලු |
| 13. | 169 | උලු |
| 14. | 49 | ක්‍රියාවිරහිත රූපවාහිනිය |
| 15. | 72 | අබලන් වූ කණ්නාඩි අල්මාරිය |
| 16. | 72 | මුහුණබලන කණ්නාඩි මේස 01 යි |
| 17. | බී49/98 | දිශාමාන එකයි |
| 18. | බී. 116/03 | වතුර පොම්ප එකයි |
| 19. | බී. 129/03 | බිත්ති ඔරලෝසු 02 යි |
| 20. | 49 | ටේලරය |
| 21. | බී. 41/2000 | එස්. 1520 දරන පාපැදිය |
| 22. | ඒආර් 01/04 | සී. සී. ඩී. 45354 ලුමාලා පිරිමි පාපැදිය හා කාන්තා පාපැදිය |
| 23. | ඒ.ආර්. 08/09 | ලුමාලා වර්ගයේ කාන්තා පාපැදිය |
| 24. | බී.78/96 | බෝට්ටු එන්ජින් 02 යි |
| 25. | ඒආර් 121/04 | බෝට්ටු එන්ජින් 01 යි |
| 26. | ඒ.ආර් 13/04 | පිත්තල පහන් එකයි |

01-329

# රජයේ නොවන දැන්වීම්

## සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

වර්ෂ 2007, අංක 7 දරන සමාගම් පනතේ 9 (2) ඡේදය ප්‍රකාර පහතින් නම සඳහන් සමාගමෙහි නම 2011 නොවැම්බර් මස 24 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, වෙනස් කර ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

මීට පෙර භාවිතා කළ නම : ඉන්ඩියන් ඕෂන් P & I ක්ලබ් එසෝෂියේෂන් ඔෆ් සිලෝන්
නව නාමය : සිලෝන් ෂිප්ඕනර්ස් මියුචුවල් P & I ක්ලබ්
සමාගමේ අංකය : GA 2450.

සමාගම් ලේකම්වරු.

01-321/1

## නිවේදනය

වර්ෂ 2007, අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ලීගල් අයි (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : PV 82357
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 22/14, නන්දිමිත්‍ර පෙදෙස, කොළඹ 06
ලියාපදිංචි කළ දිනය : 2011 නොවැම්බර් මස 08.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-321/2

## නිවේදනය

වර්ෂ 2007, අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : රේ සාකර් හාඩ් ඇසෙට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 82795
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි කළ දිනය : 2011 නොවැම්බර් මස 30 වැනි දා.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-321/3

## නිවේදනය

වර්ෂ 2007, අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : රේ සාකර් පොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : PV 82974
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි කළ දිනය : 2011 දෙසැම්බර් මස 08.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-321/4

### නිවේදනය

වර්ෂ 2007, අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : රනඅවේ බේ (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : PV 82957
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි කළ දිනය : 2011 දෙසැම්බර් මස 08.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-321/5

### නිවේදනය

වර්ෂ 2007, අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ජේ ඇන්ඩ් ගෝ (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : PV 83221
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි කළ දිනය : 2011 දෙසැම්බර් මස 19.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-321/6

### නිවේදනය

වර්ෂ 2007, අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සෙරෙන්ඩිපිටි එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : PV 82572
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි කළ දිනය : 2011 නොවැම්බර් මස 18.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-321/7

### නිවේදනය

වර්ෂ 2007, අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සම්බොඩි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 82577
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි කළ දිනය : 2011 නොවැම්බර් මස 18.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-321/8

### දැන්වීමයි

2007, අංක 7 දරන සමාගම් පනතෙහි 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව කෙරෙන දැන්වීමයි.

නම : ටෙක්ස්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලිපිනය : වල්ගම, බටපොත, බණ්ඩාරගම
සංස්ථාපනය කළ දිනය : 2011.12.23
සංස්ථාපිත අංකය : PV 83336

කේ. ඒ. කේ. ටී. පෙරේරා,
සමාගම් ලේකම්.

අංක 240/ඒ/5,
ගල්කඩේ හන්දිය,
වැල්මිල්ල, බණ්ඩාරගම.

01-317

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : විෂන් සෝලර් පවර් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි කළ දින : 2011.11.23
සමාගමේ අංකය : පී. වී. 82665
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : "ලිලීඩේල්", බටගම නෝර්ත්, ජාඇල.

අධ්‍යක්ෂක මණ්ඩලයේ නියෝගය පරිදි,

ජී. පී. රණසිංහ,
සමාගම් ලේකම්.

01-337

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : බෙස්ට් රියල් ඉන්වෙස්ට් කො සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2011.12.15
සමාගමේ අංකය : පී. වී. 83169
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 9/10, කේම්බ්‍රිජ් පෙදෙස, කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

ජී. පී. රණසිංහ,
සමාගම් ලේකම්.

01-338

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : කැලිස්ටා ග්‍රැෆික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2011.10.13
සමාගම් අංකය : පී. වී. 81862
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 65 බී, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

ජී. පී. රණසිංහ,
සමාගම් ලේකම්.

01-339

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සන්ෂයින් ට්‍රේඩිං ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් (පී වී ටී) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2011.11.24
සමාගමේ අංකය : පී. වී. 82699
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 8, ජාවත්ත ඇවනිව්, කොළඹ 05.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

ජී. පී. රණසිංහ,
සමාගම් ලේකම්.

01-340

---

## ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 17 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තියට අනුව දැන්වීමයි

සමාගමේ නම : ගම්පහ නේෂන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියා පදිංචි අංකය : පීවී 82876
ලියාපදිංචි කළ දිනය : 2011.12.02
සමාගමේ ලිපිනය : අංක 3/2/1, වීරසිරි ගොඩනැගිල්ල, නුවර පාර, යක්කල.

අධ්‍යක්ෂ.

01-348

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මාලබේ, ජය පාර, මුල්ලේරියාව පටුමග, අංක 421/එච් හි පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 706871993 V) හිමි ගල්වොලු කංකානමලාගේ දයානි ශ්‍යාමලී ගුණසේකර වන මා විසින් එකී ශ්‍රී ලංකා ජනරජයේ යක්කල, පිටුවල්ගොඩ පාර, අංක 92/37/1 දරන ස්ථානයෙහි පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 746370326V) හිමි ගල්වොලු කංකානමලාගේ සංජීවා ප්‍රියංගනී පෙරේරා යන අය, මාගේ ඇටෝර්නි බලකරු වශයෙන්, වර්ෂ 2007 ජනවාරි මස 03 වැනි දින ශ්‍රියානි පූගොඩ පාර, මණ්ඩාවල ලිපිනයේ ජී. කේ. ගුණසේකර පෙරේරා නොතාරිස්තැන විසින් සහතික කරන ලද හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලිඛිත බලධාරියාට හා ඇටෝර්නි බලපත්‍ර පොතේ 350 කාණ්ඩයේ 33 පත් ඉරුවේ 804 දින පොතේ 2007.01.19 වැනි දාතමින් ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් කරන ලද පත්කිරීම අද දින සිට මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කළ බවත් මින් ඉදිරියට එකී ගල්වොලු කංකානමලාගේ සංජීවා ප්‍රියංගනී පෙරේරා යන අය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් කිසිදු වගකීමක් නොදරන බවත්, ශ්‍රී ලංකා ජනරජය සහ මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

ගල්වොලු කංකානමලාගේ දයානි ශ්‍යාමලී ගුණසේකර.

01-283/2

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මාලබේ, ජය පාර, මුල්ලේරියාව පටුමග, අංක 421/එච් හි පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 692151640 V) හිමි සුරවීර මුහන්දිරම්ගේ දොන් රංජිත් වන මා විසින් එකී ශ්‍රී ලංකා ජනරජයේ යක්කල, පිටුවල්ගොඩ පාර, අංක 92/37/1 දරන ස්ථානයෙහි පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 722820800 V) හිමි මුණසිංහ ආරච්චිගේ තුෂාර රෝහන් චන්ද්‍රසේන යන අය, මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් වර්ෂ 2008 ජනවාරි මස 10 වැනි දින ශ්‍රියානි පූගොඩ පාර, මණ්ඩාවල ලිපිනයේ ජී. කේ. ගුණසේකර පෙරේරා නොතාරිස්තැන විසින් සහතික කරන ලද හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ 375 කාණ්ඩයේ 83 පත් ඉරුවේ 1029 දින පොතේ 2008.01.30 දාතමින් ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් කරන ලද පත්කිරීම අද දින සිට මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කළ බවත් මින් ඉදිරියට එකී මුණසිංහ ආරච්චිගේ තුෂාර රොහාන් චන්ද්‍රසේන යන අය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් කිසිදු වගකීමක් නොදරන බවත්, ශ්‍රී ලංකා ජනරජය සහ මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

සුරවීර මුහන්දිරම්ගේ දොන් රංජිත්.

01-283/1

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය අනුව සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ දැන්වීම

පැරණි නම : සැෆ්‍රන්ස් කේටරිං (පීවීටී) එල්ටීඩී
අංකය : පී වී 80659
අළුත් නම සහ වෙනස් වූ දිනය : සැෆ්‍රන් ෆුඩ්ස් (පීවීටී) එල්ටීඩී, 2011.12.05
ලියාපදිංචි ලිපිනය : අංක 10, මයිල් පෝස්ට් ඇවනිව්, කොළඹ 03.

ලේකම්.

දුරකථන අංක : 2689618.

01-225/3

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

සමාගමේ නම : කැන්ඩෙලා ලර්නින් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 82821
ලියාපදිංචි කර්යාලීය ලිපිනය : අංක 77, නුන්ගමුගොඩ පාර, කැළණිය
ලියාපදිංචි කළ දිනය : 2011 නොවැම්බර් 13.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-217/1

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

සමාගමේ නම : සීඅයිඑම්බී (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 82537
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි කළ දිනය : 2011 නොවැම්බර් 28.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-217/2

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

සමාගමේ නම : ඩිරෙක්ට් එෆ් එන් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 83133
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 60, ඩේවිඩ්සන් පාර, කොළඹ 04
ලියාපදිංචි කළ දිනය : 2011 දෙසැම්බර් 16

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-254/2

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

සමාගමේ නම : ඩිසයින් ඇටෙලියර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 82666
ලියාපදිංචි කර්යාලීය ලිපිනය : අංක 14/4, පාක් වීදිය, කොළඹ 02
ලියාපදිංචි කළ දිනය : 2011 නොවැම්බර් 23.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-254/1

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2011 අගෝස්තු මස 15 වැනි දින සිට ලියාපදිංචි කර ඇත.

සමාගමේ නම : නිව් කඩවත ජුකී (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 80518
ලියාපදිංචි ලිපිනය : අංක 161/4/බී නුවර පාර, මහර, කඩවත.

අධ්‍යක්ෂ.

01-257

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරන මහජන දැන්වීම

නම : කලම්බු ඉලෙක්ට්‍රික් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලි. ප. අංක : පී වී 82787
ලි. ප. ලිපිනය : අංක 47/40, පැලැන්වත්ත, පන්නිපිටිය.

01-278

---

## දැන්වීමයි

2007 අංක 7 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතන සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : බෲක් වැලි හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 82459
ලියාපදිංචි දිනය : 2011.11.14
ලියාපදිංචි ලිපිනය : අංක 358, ජයන්තිමහල් බිල්ඩින්, පැපිලියාන හන්දිය, පැපිලියාන, බොරලැස්ගමුව.

සමාගමේ නම : අක්නලිර්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 82638
ලියාපදිංචි දිනය : 2011.11.21
ලියාපදිංචි ලිපිනය : අංක 27/1, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.

සමාගමේ නම : සී ඩබ්ලිව් ඇග්‍රිගේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 82486
ලියාපදිංචි දිනය : 2011.11.17
ලියාපදිංචි ලිපිනය : අංක 85, පළමු මහල, හයිලෙවල් ප්ලාසා, දෙල්කඳ, නුගේගොඩ.

සමාගමේ නම : සී ජේ ඉන්වෙස්ට්මන්ට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 83093
ලියාපදිංචි දිනය : 2011.12.13
ලියාපදිංචි ලිපිනය : අංක 269/4, හතරවන වීදිය, චන්ද්‍රන උද්‍යානය, පමුණුව පාර, මහරගම.

ඩබ්. එස්. වීරමන්,
ලේකම්.

අංක 27/1, පැපිලියාන පාර,
නැදිමාල,
දෙහිවල.

01-229

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කඩවත, සූරියපාළුව, අංක 95/15/7 දරන ස්ථානයේ පදිංචි සහ දැනට ඉතාලිය, මිලානෝ, 20145, වියා මාරියෝ පගානෝ 42 හි පදිංචි ලීලානන්ද දසානායක වන මම ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. ඩී. උපුල් දේශප්‍රිය මහතා විසින් 2009.06.10 වැනි දින ලියා සහතික කළ අංක 1604 දරන ඇටෝර්නි බලපත්‍රය මත කඩවත, සූරියපාළුව අංක 95/15/4 දරන ස්ථානයේ පදිංචි මැදවෙල හේරත් මුදියන්සේලාගේ ජේමදාස යන අයට පවරා දුන් ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවට මෙයින් දැනුම් දෙමි.

ලීලානන්ද දසනායක.

වියා මාරියෝ පගානෝ 42,
20145, මිලානෝ,
ඉතාලිය.

01-221

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : වී සෝන් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී වී 78370, 2011.04.18
ලියාපදිංචි ලිපිනය : අංක බී 34, මොස්කුවඩි, හපුගස්තලාව.

අධ්‍යක්ෂ.

01-225/1

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : සුප්‍රීම් ජෙම් සෙන්ටර් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී වී 82951, 2011.12.07
ලියාපදිංචි ලිපිනය : අංක 221/3, ධර්මපාල මාවත, කොළඹ 07.

කන්සල්ටන්ට්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංක : 2689618.

01-225/2

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත

ඉන්වෙස්ට් ෆස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් - පී වී 83185

ඉහත සඳහන් සමාගම 2011 දෙසැම්බර් මස 16 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 22 9/3 කුවින්ස් පාර, කුවින්ස් කෝට්, කොළඹ 03 ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

බී. ඩී. ඕ. සෙකට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 65/2 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

01-227

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත

පැපිරස් ප්‍රින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් - පී වී 82805

ඉහත සඳහන් සමාගම 2011 නොවැම්බර් මස 30 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 38/17 ගෝවර වීදිය කොළඹ 05 ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

බී. ඩී. ඕ. සෙකට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 65/2 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

01-226

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත

බිස්පැක් (ප්‍රයිවට්) ලිමිටඩ් - පී වී 82500

ඉහත සඳහන් සමාගම 2011 නොවැම්බර් මස 15 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 70, කේ. සී. සී. පෙරේරා මාවත, කොළඹ 13, ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

බී. ඩී. ඕ. සෙකට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලේකම්වරු.

අංක 65/2 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

01-228

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

ලියාපදිංචි සමාගමේ නම : බිස්නස් වෙන්චර් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 82654
ලියාපදිංචි කළ දිනය : 2011.11.22
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 453/1, පළමු මහල, හැව්ලොක් පාර, කොළඹ 06

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස්
ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-238/2

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

ලියාපදිංචි සමාගමේ නම : ද බිලින්ග් බුටික් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 82700
ලියාපදිංචි කළ දිනය : 2011.11.24
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 50, ශ්‍රී සරණංකර පාර, දෙහිවල

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස්
ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-238/1

## නිවේදනයයි

පහත සඳහන් සමාගම 2011.10.04 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සීමාසහිත ෆාම්කොවෙම් ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 76280
ලියාපදිංචි කාර්යාලය : අංක 266/2, ශාන්ත ප්‍රැන්සිස් මාවත, දළුගම, කැළණිය

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සීමාසහිත බිස්නස් සෙකටේරියල්
සර්විසස් (පෞද්ගලික) සමාගම
සමාගම් ලේකම්වරු.

පී වී 13045

01-241

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තියේ විධිවිධාන අනුව පහත දැක්වෙන ආයතනය ඇපයෙන් සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

| *සමාගමේ නම* | *අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලය* |
|---|---|---|---|
| ෆයර්ඩොව් ඉන්ටර්නැෂනල් | G. A. 2632 | 2011.11.22 | හෙන්ඩ්රි කොස්තා මාවත හරහා, වටවන, පුත්තලම පාර, හලාවත |

සමාගම් ලේකම්.

01-206

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සෙලාන් බැංකුව පීඑල්සී - වැලිවේරිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකිණීම

මෙම දේපල වැලිවේරිය පදිංචි මැනුවෙල් පීරිස් වඩුගේ ක්‍රිස්ටි ජයලත් පීරිස් මහතා යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

#### පළමු වැනි වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ නැගෙනහිර වැලිවේරිය පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් සාදන ලද 2001.08.13 දිනැති අංක 7547 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මිල්ලගහවත්ත කොටසක් නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 7547 දරන සැලැස්ම අනුව පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල එහි පිහිටි සියලු දේ සහිත ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 508/256 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2012 පෙබරවාරි මස 14 වැනි දින පෙරවරු 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.-* වැලිවේරිය සිට නව නුවර පාර ඔස්සේ බැලුම්මහර දෙසට කි. මී. 1.5 ක් පමණ ගිය විට මාර්ගයේ දකුණු පස අදාල දේපළ පිහිටා ඇත. අදාල දේපළ හින්පන්විල විහාරස්ථානයට මීටර් 50 ක් ඉදිරියෙන් ඇත.

#### 2 වැනි වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, නැගෙනහිර වැලිවේරිය පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් සාදන ලද 2001.11.27 දිනැති අංක 7547 ඉ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මිල්ලගහවත්ත නමැති ඉඩමේ ලොට් බී 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 7547 ඉ දරන සැලැස්ම අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල එහි පිහිටි සියලු දේ සහිත ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 508/259 හි ලියාපදිංචි කර ඇත.

පෙර කී අංක 7547 ඕ දරන සැලැස්මේ ලොට් සී ලකුණු කළ (අඩි 12 ක් පළල පාර) පාර සඳහා වෙන් කිරීම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

*දේපලට පිවිසීම.-* වැලිවේරිය සිට නව නුවර පාර ඔස්සේ බැලුම්මහර දෙසට කි. මී. 1.5 ක් පමණ ගිය විට මාර්ගයේ දකුණු පස ෆියුම් ට්‍රේඩර්ස් ආයතන පිටුපස අදාල දේපල පිහිටා ඇත. දේපල සඳහා අඩි 15 ක මාර්ග වෙන් කිරීමක් ඇත.

ඉහත සඳහන් දේපළ 2012 පෙබරවාරි මස 14 වන දින පෙරවරු 11.15 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2009.12.18 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2009.11.12 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2009.11.10 වැනි දින ද පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. 1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක් 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකල යුතුය. හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමනාකරු (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලුපාර, කොළඹ 03, දු.ක. 011-2456458, 2456480

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940

01-352

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එල්. පී. ජයරත්න
ගිණුම් අංක : 0066 5000 2472

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010.06.24 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසි එක් ලක්ෂ දහ නම දහස් අසූ තුනයි ශත හතලිස් හතරක (රු. 21,19,083.44) මුදල ද, 2010 මාර්තු මස 26 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහ අට ලක්ෂ හැත්තෑ දහස් හැත්තෑ හතයි ශත පනස් හයක (රු. 1,870,077.56) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2011.12.09 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2011.11.25 දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2012.01.30 වැනි දින ප. ව. 2.30 ට

පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලය නගරයේ සහ ග්‍රැවට්ස් හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "ලව් ලේන් 244" හි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ලව් ලේන් ග්‍රාමයේ පිහිටි "ලව් ලේන්" යයි කියනු ලබන හා හඳුන්වනු ලබන බෙදාවෙන් කොට ඇති ඉඩම් පරිශ්‍ර කොටසට මායිම් උතුරට : පාර, නැගෙනහිරට : අංක TR.N. 71/168 දරන පිඹුරේ ලොට් 19, දකුණට : වෙන්කිරීම් ඉඩම සහ බස්නාහිරට : රජයේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (අ. 0 රූ. 0 පර්. 30) විශාල ඉඩම් පරිශ්‍ර කොටසය.

ඉහත කී ඉඩම් පරිශ්‍රයන් පහත සඳහන් පරිදි මනිනු ලැබ හා නිරූපනය කරනු ලැබ ඇත.

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලය නගරය සහ ග්‍රැවට්ස් හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ත්‍රිකුණාමලය නගර සභා සීමාවන් තුළ ලව් ලේන් හි පිහිටි මොරටුව බලයලත් මානක තැන එල්. එන්. ප්‍රනාන්දු යන අය විසින් අඳිනු ලැබ ඇති සහ 2000.03.07 දාතම හා අංක 2002 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් "ඒ" වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : පාර, නැගෙනහිරට : T. R. N. අංක 71/168 දරන පිඹුරේ "ලොට් 19", දකුණට : වෙන්කිරීම් ඉඩම සහ බස්නාහිරට : රජයේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (අ. 0 රූ. 0 පර්. 30) විශාල ඉඩම් කොටස සමග වෙළුම/පත්‍රිරුව LD/TG 28/135 යටතේ ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-375/1

---

ලක්ෂ හතලිස් පන් දහස් එකසිය අසූවයි ශත විසි හයක (රු. 17,45,180.26) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයයි දශම පහක් (19.5%) බැගින් වූ පොලියද ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.08.07 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2009.07.23 වැනි දින "දිවයින" "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2012.01.30 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අදිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (දෙල්ගොඩ උප කාර්යාලය) අකුරුමුල්ල ග්‍රාමයේ පිහිටි බලයලත් මානක තැන පී. ඩබ්ලිව්. ලීලාරත්න විසින් සාදන ලද 1999 නොවැම්බර් මස 13 දාතම හා අංක 228/99 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 4 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 03 නැගෙනහිරට : ජී. ඒ. ප්‍රේමසිරි සහ පියසේන යන අයගේ ඉඩම්, දකුණට : ලොට් 05 සහ බස්නාහිරට : ලොට් 6 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් 01යි පර්චස් තිස් දෙකක් (අ. 0 රූ. 1 පර්. 32) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද එකී පිඹුරු අංක 228/99 ට අනුව වෙළුම/පත්‍රිරුව සී 783/130 හි ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පිඹුරු අංක 228/99 හි නිරූපිත ලොට් 6 සහ ලොට් ආර් මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-375/2

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් දැන්වීම

ඩොග්ඩ් සුප්‍රිම් සර්විසස්
ගිණුම් අංක : 0037 1000 5639

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009 ක් වූ මාර්තු මස 13 වැනි දින සීමාසහිත සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 3751 ප්‍රකාර රුපියල් විසිලක්ෂ එක් දහස් නමසිය හතලිස් එකයි ශත හැත්තෑහයක (රු. 20,01,941.76) මුදලක් 2009 දෙසැම්බර් මස 18 වැනි දින සිට අංක 3751 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දාහත්

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් දැන්වීම

එස්. ඒ. සී. එස්. ද සිල්වා
ගිණුම් අංක : 0007 5001 4739

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 1999 අගෝස්තු මස 12 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව අංක 19901 දරන බැඳුම්කරය මත රුපියල් තුන් ලක්ෂ පනස් හතර දහස් හාරසිය හතයි ශත හතළිහක (රු. 3,54,407.40) මුල් මුදල ද, 1998 ජූලි 01 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්ෂ

හතලිස් අට දහස් දෙසිය අසූ නමයයි ශත විසි හයක (රු. 248,289.26) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි පහක් (25%) බැගින් වූ පොලිය ද, හා අංක 20214 දරන බැඳුම්කරය මත රුපියල් තුන් ලක්ෂ විසි අට දහස් හැත්තෑ දෙකයි ශත අටක (රු. 328,072.08) මුල් මුදල ද, 1998 ජූලි 01 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්ෂ තිස් පන් දහස් හාරසිය අසූ නමයයි ශත තිස් එකක (රු. 235,489.31) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි පහක් (25%) බැගින් වූ පොලිය ද, දන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.12.10 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2010.11.30 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2012.01.31 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොල ලියාපදිංචි කොට්ඨාසයේ උඩ පළාතේ ගඟ පහළ කෝරළේ ගම්පොල පිහිටි සිංහපිටිය එස්ටේට් යයි කියනු ලබන හා හඳුන්වනු ලබන D 171/156 හි ලියාපදිංචි කොට ඇති වතු වගාව හා පරිශ්‍රයන් සහ ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනක් සහ පර්චස් විසි පහක් (අ. 2 රූ. 3 පර්. 25) විශාල බලයලත් මානක තැන ඊ. ආර්. ක්ලාස් යන අය විසින් සාදන ලද 1947 පෙබරවාරි මස 13 දාතම හා අංක 700 දරන පිඹුරේ නිරූපිත ලොට් 13 ඩී වශයෙන් ලකුණු කොට ඇති බෙදා වෙන් කොට ඇති කොටසින් සහ අංක D 171/225 හි ලියාපදිංචි කොට ඇති බලයලත් මානක තැන ඊ. ආර්. ක්ලාස් යන අය විසින් සාදන ලද 1947 අගෝස්තු 31 දාතම හා අංක 778 දරන පිඹුරේ නිරූපිත ප්‍රමාණයෙන් අක්කරයකින් ලොට් 13 ඩී 1 වශයෙන් ලකුණු කොට ඇති බෙදා වෙන් කොට ඇති කොටසින් උතුරු දෙසට ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි නමයක් (අ. 0 රූ. 1 පර්. 29) ප්‍රමාණයෙන් විශාල බලයලත් මානක තැන එච්. ඩී. ජී. රොඩ්රිගෝ යන අය විසින් සාදන ලද 1949 ජනවාරි මස 25 දාතම හා අංක 407 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණුකොට බෙදා වෙන් කොට ඇති කොටස අත්හැරීමෙන් පසු ඉතිරිය දකුණු දෙසට වන ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් එකොළහක් (අ. 0 රූ. 2 පර්. 11) ප්‍රමාණයෙන් විශාල බෙදා වෙන් කොට ඇති විශේෂිත වූ දකුණු දෙසට වන ඉතිරි කොටසට මායිම් උතුරට : ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩබ්ලිව්. ආර්. ද සිල්වා යන අය විසින් ලියා සහතික කරන ලද 1949 පෙබරවාරි 09 දාතම හා අංක 5367 දරන ඔප්පුව මත විකුණූ සහ බලයලත් මානක තැන එච්. ඩී. ජී. රොඩ්රිගෝ යන අය විසින් සාදන ලද 1949 ජනවාරි 25 දාතම හා අංක 407 දරන පිඹුරේ ලොට් 2, නැගෙනහිරට : ජිනරාජ පාසලට විකුණූ ඉඩම (වර්තමානයේ ජිනරාජ පාසලට අයත් සින්නපිටය එස්ටේට් හි කොටසක් වෙන් කරන පැළ ඉණි වැට) දකුණට : දොලොස්බාගේ සිට පාර සහ බස්නාහිරට : ලොට් 13 ඩී යන මායිම් තුළ විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ ගොඩනැගිල්ල සමග වෙළුම/පත්‍රිරුව සී 10/244 යටතේ ලියාපදිංචි කොට ඇත.

මෙම ඉඩම බලයලත් මානක තැන බී. ඒ. ජාගොඩ යන අය විසින් 1995.02.10 දින මනිනු ලැබ ඇති අතර ඔහුගේ පිඹුරු අංක 3336 හි ලොට් අංක 1 සහ 2 වශයෙන් නිරූපණය කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-375/3

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පංචිකාවත්ත ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ආර්. එම්. ඒ. මෝටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමට සපයන ලද ණය මුදල් ආපසු ගෙවන බවට සුරැකුමක් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2008.11.10 දින සහ අංක 3345 දරන බැඳුම්කරය යටතේ ආර්. එම්. ඒ. මෝටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට සහ රාජපක්ෂ මුදියන්සේලාගේ අබේපාල යන අය උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් තවද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ණයකරු සහ උකස්කරු වශයෙන් සමාගමට රාජපක්ෂ මුදියන්සේලාගේ අබේපාල වෙත සපයන ලද ණය මුදල ආපසු ගෙවන බවට සුරැකුමක් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2002.04.10 දින සහ අංක 1033 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදලක් ආපසු ගෙවීම පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුළුව සියලු මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේ දී 2012 පෙබරවාරි මස 08 වන දින පෙ.ව. 10.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුල ආඬිඅම්බලමේ පිහිටි "පීල්ලවත්ත එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. එම්. ජී. ඩයස් විසින් මැන සාදන ලද 1987.01.22 සහ 15 දිනයන්හි අංක 833 පී. පී. /86 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 23 ලෙස ලකුණු කර ඇති පර්චස් 20 විශාල ඉඩම (අ. 0, රූ. 0, පර්. 20) (එකී අංක 3345 සහ 1033 දරන උකස් බැඳුම්කරයන්හි උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය සමග වේ.)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.04.15 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.05.09 වැනි දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම*.- මීනුවන්ගොඩ සිට මීගමුව පාරේ කි. මී. 4 ක් ගිය පසු පීල්ලවත්ත හංදියෙන් දකුණට හැරී විජය මාවත දිගේ මීටර් 900 ක් ගිය විට අංක 155/23 බිම් ප්‍රමාණයේ දේපල දකුණු අත පැත්තේ පාරට මුහුණලා පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම් ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට

